# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 මාර්තු මස 08 වන දින පෙ.ව 9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු එස්. ඒ. ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබද අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්ණය: (ප්‍ර/ VI(I)/16/04)

(අ). ඔබතුමා විසින් බස්නාහිර පළාතේ පළාත් සභාවේ කිසියම් මන්ත්‍රීවරයෙක් අධීක්ෂණ තනතුරෙහි පිහිටුවා තිබේද?

(ආ). එසේ පිහිටුවා තිබේනම් ඒ කුමන විෂයන් යටතේද?

(ඇ). ඒ මන්ත්‍රීවරුන්ගේ නම් ඔබතුමා විසින් සඳහන් කරන්නේද?

(ඈ). මේ වන විට කඩුවෙල මහ නගර සභාවේ පරිපාලන කටයුතු හා කොන්ත්‍රාත් පැවරීම්, සංවර්ධන කටයුතු අඩිය හිටපු නගරාධිපතිවරයාගේ හා ගරු මංජුල බුද්ධදාස මන්ත්‍රීතුමාගේ මැදිහත් වීමෙන් සිදු වන බව ඔබතුමා දන්නේද?

(ඉ). ඒ සඳහා ඔබතුමා යම් බලයක් පවරා තිබේද?

(ඊ). එසේ බලයක් පවරා නොමැතිනම් ඔවුන්ගේ බලපෑමෙන් සිදුකෙරෙන මෙවැනි කටයුතු නවතාලීමට ඔබතුමා යම් පියවරක් ගන්නේද?

02. ගරු එස්. ඒ. ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින්, ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ VI(I)/16/05)

(අ). කඩුවෙල මහ නගර සභාවේ රියදුරන් හිටපු නගරාධිපති බුද්ධදාස මහතාගේ හා ඔහුගේ පුත් ගරු මංජුල බුද්ධදාස මන්ත්‍රීතුමාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්තව කටයුතු කළ බව ඔබතුමා දන්නේද?

(ආ). ඒ සඳහා ඔබතුමා හෝ පළාත් පාලන ආයතන ප්‍රධානීන් අවසර ලබා දී තිබේද?

(ඇ). එසේ අවසර ලබා දී නොමැතිනම් එසේ යොදා ගැනීම තුළින් කඩුවෙල මහ නගර සභාවට හා මහජනතාවට සිදු වූ අලාභය අයකර ගැනීමට කුමන අයුරින් කටයුතු කරන්නේද?

(ඈ). මෙසේ රජයේ සේවකයන් අයථා හා නීත්‍යානුකූල නොවන අයුරින් දේශපාලඥයින්ගේ පෞද්ගලික කටයුතු වලට යෙදවීමට හා වෙනත් බාහිර පාර්ශවයන්ට නගර සභාවේ කටයුතු වලට මැදිහත් වීමට ඉඩ සලසා දෙන කඩුවෙල මහ නගර සභාවේ වගකිව යුතු ඉහළ නිළධාරීන් පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද?

03. ගරු බුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර, සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම් කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ VI(I)/16/06)

(අ). පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග පිළිසකර කිරීම සඳහා 2012, 2013, 2014, 2015 යන වසර වල වැය කළ මුළු මුදල කොපමණද?

(ආ). එම කාලය තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොන්ක්‍රීට් කළ මාර්ග මොනවාද?

(ඇ). එම කාලය තුළ කාපට් යෙදූ මාර්ග මොනවාද?

(ඈ). එම කාලය තුළ ඉන්ටර් ලොක් ගල් ඇල්ලූ (කුට්ටි ගල් ඇල්ලූ) මාර්ග මොනවාද?

(ඉ). මෙම මාර්ග අතර මීගමුව මහ නගර සභාවට අයත් මාර්ග තිබේද? එම මාර්ග මොනවාද?

(ඊ). එම මාර්ග අතර බස්නාහිර පළාත් සභාවට අයත් මාර්ග තිබේද? එම මාර්ග මොනවාද?

(උ). මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග පිළිසකර කිරීම සඳහා වැය කළ මුදල් එකී වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන දන්වන්නේද?

04. ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර, සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම් වතු යටිතල පහසුකම් කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/07

(අ). පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව (චෝගම්) පැවති කාලයේ බත්තරමුල්ලේ පිහිටි "අපේ ගම" භූමියට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පස් යෙදූ බව ඔබතුමා දන්නේද?

(ආ). එම භූමියට යෙදූ පස් කියුබ් ගණන කොපමණද?

(ඇ). කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනය කුමක්ද? කොන්ත්‍රාත්කරු කවුද?

(ඈ). ඒ සඳහා කොපමණ මුදලක් වැය කළේද?

(ඉ). මේ සඳහා මුදල් ගෙවූ ආයතනය කුමක්ද?

05. ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිලිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/08)

(අ). හෝමාගම අධ්‍යාපන කළාපයට අයත් පිටුම්පෙ කණිෂ්ඨ විද්‍යාලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද?

(ආ). මෙම පාසලේ පංති දෙකක් පවත්වනුයේ 20' × 20' තරම් වූ කුඩා කාමරයක බව ඔබතුමා දන්නේද?

(ඇ). 2012 වර්ෂයේ මෙම පාසලට තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කළ බව ඔබතුමා දන්නේද?

(ඈ). මෙම ඉදිකිරීම් අතරමග නතර කිරීමට හේතුව කුමක්ද?

(ඉ). පන්ති කාමරවල තදබදය අවම කිරීම සඳහා මෙම අඩක් නිම කළ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ අවසන් කිරීමට ඔබතුමා අදහස් කර තිබේද?

(ඊ). 2016 වසරේ මෙම ගොඩනැගිල්ලේ කොටසක් හෝ සම්පූර්ණ කිරීමට ප්‍රතිපාදන ලබාදිය හැකිද?

06. ගරු එම්.එස්. එම්. ෆයිරුස් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිලිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/09)

(අ). බස්නාහිර පළාත් සභාවේ ලියාපදිංචි පෙර පාසල් කීයක් තිබේද? ඒවා මොනවාද?

(ආ). පෙර පාසලක් ලියාපදිංචි කිරීමේදී සලකා බලනු ලබන නිර්ණායකයන් මොනවාද?

(ඇ). ලියාපදිංචි පෙර පාසැල් අදාළ නිර්ණායකයන්ට අනුව පවත්වාගෙන යනු ලබන්නේ දැයි පසු විපරම් කරනු ලබන්නේද?

(ඈ). ප්‍රශ්න අංක (ඇ) හි පිළිතුර "ඔව්" නම් පසුගිය වසරවල සිදු කරන ලැබූ පසු විපරම් පිළිබඳ විස්තර මොනවාද?

(ඉ). ප්‍රශ්න අංක (ඇ) හි පිළිතුර "නැත" නම් ඒ මන්ද?

(ඊ). පළාත් සභාව හැර පෙර පාසලක් ලියා පදිංචි කිරීමේ වෙනත් ආයතන තිබේද? තිබේනම් ඒවා මොනවාද?

(උ). ලියාපදිංචි වී නොමැති පෙර පාසැල් බස්නාහිර පළාතේ තිබේද? තිබේනම් ඒවා පිළිබඳව ගන්නා පියවර කුමක්ද?

07. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/10)

(අ). 2015.12.31 වන විට කලාප හා පළාත් වශයෙන් ගුරු හා විදුහල්පති සේවාවල සිදු කරන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ). ඉන් මූලික විමර්ශණ මතයැයි සඳහන් කරමින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිළධරයින්ගේ නාමලේඛණ හා ඊට අදාල දින වකවානු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ). එම විනය පරීක්ෂණ පැවැත්වෙන නිළධරයන්ගෙන් මාස 03ක් ඉක්මවා තිබියදීත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ නිළධාරීන් කවරේද?

(ඈ). ඒ පිළිබඳව වෙන් වෙන් වශයෙන් මෙම ගරු සභාවට කරුණු දක්වන්නේද?

08. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/11)

(අ). බස්නාහිර පලාත තුළ 2016 වර්ෂයට අදාලව කලාප තුළ, කලාප අතර, පිට පළාත් හා ජාතික පාසැල් සේවය සඳහා ගුරු හා විදුහල්පති සේවාවන්හි ස්ථාන මාරුවීම් අයැදුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව ඒ ඒ සේවාවන්ට අදාළව කොපමණද?

(ආ). එම ස්ථාන මාරුවීම් වලට අදාළව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල නීත්‍යානුකූලව කැඳවීමට කටයුතු කර තිබේද? ඒසේනම් ඒ කවදාද?

(ඇ). එම මාරු මණ්ඩලවල නියෝජිතත්වය නීත්‍යානුකූලද? යන්න තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කුමක්ද?

(ඈ). ඒ අනුව කටයුතු කර තිබේනම් 2016 වර්ෂයේ මාරු මණ්ඩල නියෝජිතත්වයට සුදුසුකම් ලබන වෘත්තීය සමිති මොනවාද? යන්න මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

09. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/12)

(අ). බස්නාහිර පළාත තුළ කලාප හා පළාත් වශයෙන් ස්ථාපිත වාර්ෂික මාරු මණ්ඩල මගින් 2016 වර්ෂයට අදාලව ගුරු සහ විදුහල්පති ස්ථාන මාරු සම්බන්ධයෙන් සිදු කර ඇති නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කර තිබේද?

(ආ). එසේනම් සිදුකර ඇති ස්ථාන මාරු සංඛ්‍යාව කලාප හා පළාත් වශයෙන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ). එකම පාසලේ සේවා කාලය වසර 10ට වැඩි ගුරුවරුන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට කටයුතු කර තිබේද?

(ඈ). එසේ නම් අදාළ කලාප බළධාරීන්ට බලය පවරා ඇති නෛතික ක්‍රියාපටිපාටිය කුමක්ද?

(ඉ). ඒ අනුව කලාප වශයෙන් 2016 වර්ෂයට අදාළව සිදු කර ඇති ස්ථාන මාරු වීම් සංඛ්‍යාව මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

10. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/13)

(අ). පිළියන්දල අධ්‍යාපන කළාපයේ අත්‍යාවශ්‍ය ගුරු පුරප්පාඩු ඇති බව ඔබතුමා දන්නවාද?

(ආ). එම පුරප්පාඩු අතර ප්‍රාථමික අංශයේ (1 සිට 5) පමණක් පුරප්පාඩු 54ක් බව පිළිගන්නවාද?

(ඇ). 6-11 පංති තුළ ගුරු පුරප්පාඩු ප්‍රමාණය 61 ලෙසත් අ.පො.ස. උසස් පෙළ පුරප්පාඩු 12 ක් ලෙසත්, ගැටළුකාරී තත්වයක් ඇති බව පිළිගන්නවාද?

(ඈ). ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් ඇතුළු තවත් පුරප්පාඩු 43ක් සහිතව පාසැල් පවත්වාගෙන යාමට සිදු වී ඇති බව පිළිගන්නවාද?

(ඉ). මෙතරම් පුරප්පාඩු සහිතව එකී අධ්‍යාපන කලාපයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාම ගැටළුකාරී බව පිළිගන්නවාද?

(ඊ). විසඳුම් ලෙස ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

(උ). නොඑසේනම් ඒ මන්ද?

11. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ VI(I)/16/14)

(අ). කරදියාන කසල බැහැලන ස්ථානයට මුදා හරිනු ලබන කසළ ටොන් එකක් වෙනුවෙන් පළාත් පාලන ආයතනයකින් ගෙවිය යුතු මුදල කීයද?

(ආ). මුදාහරින ටොන් 1 සඳහා පෞද්ගලික ආයතනයකින් ගෙවිය යුතු මුදල කීයද?

(ඇ). 2015 වසර තුළ ඒ ඒ පළාත් පාලන ආයතනයට අනුව ඒ ඒ මාසයේදී කසළ අංගනය වෙත මුදාහරින ලද කසළ ප්‍රමාණය කොපමණද?

(ඈ). ඒ අනුව 2015 වසරේ කරදියාන කසළ අංගනයේ කසළ මුදාහැරීම හරහා අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියට ලැබුණු මුළු ආදායම කොපමණද?

(ඉ). කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොදා ගන්නා ලද කසළ ප්‍රමාණය කොපමණද?

(ඊ). ඉන් ලද ආදායම කොපමණද?

(උ). කසළ අංගනයේ සේවක පඩිනඩි ඇතුළු ආයතනය පවත්වාගෙන යාමට 2015 වසරේ වැය කළ වියදම කීයද?

12. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ VI(I)/16/15)

(අ). මොරටුව මහ නගර සභාවේ ලිපි ශීර්ෂ යටතේ 2015.10.24 දිනැතිව, නලීන් මාන්නප්පෙරුම, අධ්‍යක්ෂක, බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරිය වෙත ලිපියක් යොමු කර ඇති බව පිළිගන්නේද?

(ආ). "කරදියාන කසළ අංගනය වෙත කසළ බැහැරලීම" ලෙස මාතෘකාව කරගත් එම ලිපියේ වාහන අංක ප්‍රමාණයක් සඳහන් කොට 2015.10.24 සිට එකී වාහන වල ගෙනෙන කසළ සඳහා ඉන්වොයිස් පත්‍ර "මොරටුව 02" නමින් සඳහන් කර බිල්පත් ඒවීමට දැනුම් දී තිබෙන බව දන්නේද?

(ඇ). එකී වාහන අංක කවරේද?

(ඈ). එලෙස බිල්පත් එවීමට ඉල්ලා සිටීමට හේතු කවරේද?

(ඉ). එකී ඉල්ලීමට අනුව කටයුතු කරන්නේද?

(ඊ). නොඑසේනම් ඒ මන්ද?

13. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යොවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/ VI(I)/16/16)

(අ). 1. කළුතර අධ්‍යාපන කලාපයේ ගුරු මහත්ම මහත්මීන්ගේ උසස් වීම් ක්‍රියාලිය සිදු කර තිබේද?

ii. නොඑසේනම් ඒ මන්ද?

(ආ). 1. උසස්වීම් කර ඇත්නම් හිග වැටුප් ගෙවා තිබේද?

ii. නොඑසේනම් ඒ මන්ද?

(ඇ). කළුතර අධ්‍යාපන කලාපයේ සම්පූර්ණ වශයෙන් උසස් වීම් ක්‍රියාවලිය සිදු කර ඇති පාසැල් මොනවාද?

(ඈ). එසේ සම්පූර්ණ කර නොමැති නම් හේතු කවරේද?

14. කාර්ය පටිපාටි රීති අංක 31ඇ(1) හි විධිවිධාන අනුව පිළිතුරු දීමට කල්ගන්නාලද ප්‍රශ්නය;

- ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන විදුලිබල හා බලශක්ති පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 වන දින සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්ණය : (ප්‍ර/V1(1)/16/ADG-02)

(අ). බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂවරයා ලෙස සේනක පී. සිල්වා මහතා පත්කල ක්‍රමවේදය ඔබතුමා දන්නේද?

(ආ). එම පත්වීම සිදුකිරීම සඳහා පුවත්පත් දැන්වීම් හෝ ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවූයේද?

(ඇ). අදාළ සැලසුම් අධ්‍යක්ෂවරයා පත් කිරීමෙන් ව්‍යවස්ථාපිත රෙගුලාසි හා ඊට අදාල නීති එනම්,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම යන 12(1)/ 12-(2) වගන්ති හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන ව්‍යවස්ථා සංග්‍රහයට අදාළ 2010.09.10 දිනැති අංක 1670/32 දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්කිරීම් වලට අදාල 2009.02.20 දිනැති අංක 1589/30 දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය යන, ව්‍යවස්ථාපිත රෙගුලාසි හා ඊට අදාළ නීති මෙම පත්කිරීම් මගින් උල්ලංඝණය වී ඇතැයි ඔබතුමා දන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

<u>යෝජනාව</u> :

"අද දින (2016-03-08 දින) විසර්ජනයෙන් අනතුරුව, මෙම පළාත් සභාව, 2016-03-23 දින, පෙ.ව 9.30ට රැස්විය යුතු අතර, 2016.03.22 දිනය (අඟහරුවාදා දින) සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කල යුතුය."

## X. පොදු කටයුතු

01. ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර, සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) විසින්, ඉදිරිපත් කරනු ලැබීමට :

<u>යෝජනාව</u> :

### <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව</u>
### <u>ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත</u>

"<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව-ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත</u>, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඵ (අ) වන ව්‍යවස්ථාව යටතේ, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2016 මාර්තු මස 17 වන දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46අ(2)(අ) වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දක්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2016.02.23 දින පැවති, බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී, නිවේදනය කර, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව, එම කාරක සභාවේ වාර්තාවද, ලැබී ඇති හෙයින්, ඒ පිළිබඳව ද සැලකිලිමත්ව, යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව තවදුරටත් මෙම පළාත් සභාවේ දී සාකච්ඡා කර එළඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය."

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා:

බස්නාහිර පළාත තුළ වතු ආශ්‍රිතව විශාල ජනතාවක් ජීවත් වන අතර, ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය යහපත් කිරීමේ සහ ඔවුන් මෙරට ආර්ථිකයේ ශක්තිමත් කොටස්කරුවන් බවට පත් කිරීමේ අරමුණෙන්, වතු පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටුවා ඇත. මෙම වතු පාසල්වල දරුවන්හට අධ්‍යාපනය නිසි පරිදි ලබාදීමට පහසුකම් රැසක් ස්ථාපිත කර ඇතත්, ඔවුන්ට අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන්ට දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුව ඇත.

එම ගුරුවරුන් පත්වන දුෂ්කරතාවයන් අතර පාසලට ළඟාවීමට ඇති ප්‍රවාහන අපහසුතාවය ප්‍රධානතම කරුණක් වන අතර, එයට විසඳුමක් ලෙස බස්නාහිර පළාතේ සේවය කරනු ලබන සියලු වතු පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ මැදිහත්වීමෙන් යතුරු පැදියක් ලබාදීමට කටයුතු කිරීම සුදුසු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි.

(යෝ/VI (1) /14/14)

### 02. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය :

විවිධ නම්, විවිධ වැඩසටහන් හඳුන්වා දෙමින් ක්‍රම ක්‍රමයෙන් ගම්බද පාසැල් වසා දැමීම මගින්, ගම තුළ අඩු ආදායම්ලාභී පවුල්වල ජන්ම ලාභී දක්ෂ දරුවන්ට මනා පාසැල් අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති අයිතිය අහිමි වෙමින් පවතී. ගම්බද පාසැල් වැසියාමෙන් වාහන මගින් දුරින් පිහිටි පාසැල් වලට යා නොහැකි ශිෂ්‍යයන් පාසැල් අධ්‍යාපනයෙන් සමුගන්නා ප්‍රවණතාවයක්ද දක්නට ඇත. එම හේතුවෙන් දෙමාපියන්ද දුෂ්කරතා රාශියකට මුහුණ දී ඇත. එහෙයින් ගම්බද පාසැල් සඳහා යලි පහසුකම් ලබා දී ගම්බද සිසුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.

(යෝ/VI (1) /15/01)

## XII. සභාව කල් තැබීම

එස්.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.02.24 දින.
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.